ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංක : PS/RD/Circular/3/2022
2022 ජනවාරි මස 12 වන දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම ආණ්ඩුකාර ලේකම්වරුන්
සියලුම දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් වෙත

ඩෙංගු රෝගය වැළැක්වීම සහ පාලනය සඳහා බහුපාර්ශ්වික ප්‍රවේශය ශක්තිමත් කිරීම

ශ්‍රී ලංකාව තුළ මේ වන විට ප්‍රධාන මහජන සෞඛ්‍ය ගැටලුවක් බවට පත්ව ඇති ඩෙංගු රෝගයේ ව්‍යාප්තිය අවදානම් මට්ටමකට ළඟා වී ඇති බැවින් සියලු ආයතනවල සක්‍රීය දායකත්වයෙන් ඩෙංගු රෝග මර්දනය සඳහා සාර්ථක ඒකාබද්ධ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට 2021.12.13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

මෑතකදී සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන, ඉදිකිරීම් පරිශ්‍ර, පාසල්, ආගමික ස්ථාන, ධීවර වරායන්, නිවාස ආදී ස්ථාන වලින් මදුරුවන් බෝවීමේ අවදානම සහිත ස්ථාන රාශියක් හඳුනාගෙන ඇති අතර, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැති බවද අනාවරණය වී ඇත. වාර්තා වන ඩෙංගු රෝගීන් අතුරින් 30%ක් පමණ වයස අවුරුදු 5-19 දක්වා වයස් කාණ්ඩයේ දරුවන් වන බැවින් පාසල් දරුවන් රෝගයට ගොදුරු වීමේ අවදානම අවම කිරීම සඳහා ද විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

දැනට පවතින කොවිඩ් - 19 රෝග පාලනය සඳහා සෞඛ්‍ය අංශ කැපවී කටයුතු කරන මෙවන් අවධියක ඩෙංගු රෝගය වසංගත තත්ත්වයක් බවට පත්වීම මගින් සෞඛ්‍ය පද්ධතිය තුළ ඇති විය හැකි දැඩි පීඩනය ද සැලකිමට ගෙන, ඩෙංගු මර්දන කටයුතු ජාතික, පළාත්, දිස්ත්‍රික්, ග්‍රාමීය හා ආයතන මට්ටමින් සෞඛ්‍ය අංශවල සහයෝගය ඇතිව ක්‍රියාත්මක කිරීමට සියලු ආයතන ප්‍රධානීන් කැප වී කටයුතු කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස දන්වමි.

1. <u>ආයතනය තුළ ඩෙංගු මර්දන හා පාලන කටයුතු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග</u>

   1.1. "ඩෙංගුවලින් තොර පරිසරයක්" ඇති කිරීම සඳහා සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පෞද්ගලික ආයතන, පාසැල් සහ ආගමික ස්ථාන ඇතුළු පොදු පරිශ්‍රයන්වල ඩෙංගු ව්‍යාප්තිය වැළැක්වීමේ සහ පාලනය කිරීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ.

   1.2. ස්වකීය ආයතනික යාන්ත්‍රණය මෙහෙයවීමට අදාළ වගකීම් දැරීමට සුදුසු ක්‍රියාකාරී පුද්ගලයෙකු ආයතන ප්‍රධානියා විසින් නම් කළ යුතු අතර, එම පුද්ගලයා ද ඇතුළත්ව ආයතනය තුළ ඩෙංගු මදුරුවන් බෝවීමට හැකි අවදානම් ස්ථාන හඳුනා ගැනීම, ඒවා ඉවත් කිරීම හා පසු විපරම් කිරීම සම්බන්ධයෙන් සක්‍රීයව දායක විය හැකි පුද්ගලයින්ගෙන් සමන්විත ආයතනික කමිටුවක් ස්ථාපිත කළ යුතුය.

   1.3. ඩෙංගු මර්දන ක්‍රියාකාරකම් අවම වශයෙන් සතිපතා ක්‍රියාත්මක විය යුතු අතර අදාළ උපදෙස් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් ලබා දෙනු ඇත. එම ක්‍රියාකාරකම්



ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

සම්බන්ධයෙන් වන වාර්තාවක් ආයතන විසින් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෙත මාසිකව ලබා දීමට කටයුතු කළ යුතුය.

2. <u>ඩෙංගු මර්දන හා පාලන කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය හා සම්බන්ධීකරණය</u>

2.1. ඩෙංගු මර්දන ක්‍රියාකාරකම් දීප ව්‍යාප්ත මට්ටමින් කාර්යක්ෂමව ඉටු කිරීමට අවශ්‍ය සියලු සම්බන්ධීකරණ කටයුතු <u>ජාතික ඩෙංගු මර්දන ඒකකය</u> මඟින් සිදු කළ යුතුය.

2.2. සෞඛ්‍ය අමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් හා පළාත් ආණ්ඩුකාරවරුන්ගේ සහභාගීත්වයෙන් ජාතික ඩෙංගු මර්දන කටයුතු අධීක්ෂණය කිරීම කළ යුතු අතර, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් යටතේ ජාතික ඩෙංගු මර්දන ඒකකය ශක්තිමත් කරමින් ඩෙංගු මර්දන ක්‍රියාකාරකම් බලගැන්වීමේ ක්‍රියාන්විතයක් දියත් කිරීම සිදු කළ යුතුය.

2.3. ඩෙංගු මර්දනය සඳහා පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමේ පාර්ශව විසින් සෞඛ්‍ය අංශ වෙත ලබාදිය යුතු සහයෝගය තහවුරු කිරීම හා අදාළ පාර්ශවයන් සම්බන්ධීකරණය කිරීමේ වගකීම පළාත් ආණ්ඩුකාරවරුන් වෙත පැවරේ.

2.4. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වල න්‍යාය පත්‍රයන්ට ඩෙංගු හා කොවිඩ් - 19 වැනි වසංගත රෝග ව්‍යාප්තිය වැළැක්වීම හා පාලනය සඳහා වන සැලසුම් හා ඒවායේ ප්‍රගතිය සාකච්ඡා කිරීම යන්න ඇතුළත් කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් වන කරුණු සමාලෝචනය කිරීමට ඉහත රැස්වීම්වල දී අදාළ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරීන් වෙත නිශ්චිත කාලයක් වෙන් කර දිය යුතු වේ.

2.5. ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා කාර්යයන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල මග පෙන්වීම හා අදාළ ප්‍රදේශයේ මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා ඇතුළු පළාත් පාලන ආයතනවල සක්‍රීය දායකත්වය මත සිදු කළ යුතුය.

2.6. ග්‍රාමීය මට්ටමේ ඩෙංගු මර්දනය සහ පාලනය කිරීමේ වැඩසටහන් සඳහා ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ස්ථාපිත කර ඇති "ග්‍රාමීය කමිටුවල" ක්‍රියාකාරී දායකත්වය ලබාගත යුතුය.

2.7. ඩෙංගු අධි අවදානම් ස්ථාන ලෙස සැලකිය හැකි ඉදිකිරීම් පරිශ්‍ර, පාසල්, ආගමික ස්ථාන ඇතුළු පොදු ස්ථාන සහ සෞඛ්‍ය අංශ විසින් ඩෙංගු අධි අවදානම් ස්ථාන ලෙස නම් කරනු ලබන වෙනත් ඕනෑම ස්ථානයක් සම්බන්ධයෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සහ ග්‍රාමීය කමිටුවල විශේෂ අවධානය යොමු විය යුතුය. ජාතික ඩෙංගු මර්දන ඒකකය සහ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ විසින් ලබා දෙන මාර්ගෝපදේශ අනුව මෙම ස්ථානයන්හි ඩෙංගු ව්‍යාප්ත වීම වැළැක්වීමට අවශ්‍ය කටයුතු නොපමාව ක්‍රියාත්මක කළ යුතුය.

2.8. පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන් විසින් පාසල්, අනෙකුත් අධ්‍යාපන ආයතන, ආගමික ස්ථාන ආදී පොදු ස්ථානවල ඩෙංගු මර්දන කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික ඩෙංගු මර්දන ඒකකය සමඟ සම්බන්ධීකරණය කළ යුතු වේ.

2.9. දැනට බලාත්මක පළාත් ආපදා කළමනාකරණ සැලැස්ම තුළ ඩෙංගු රෝග මර්දනය හා පාලනය සඳහා වන ක්‍රියාමාර්ග සෞඛ්‍ය අංශවල උපදෙස්වලට අනුකූලව ඇතුළත් කිරීමට හා එම සැලසුම් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

2.10. ඩෙංගු මර්දනය අරමුණු කොටගෙන, ඉදිකිරීම් ගිවිසුම් වලට ඉදිකිරීම් පරිශ්‍ර සඳහා වන නීතිරීති සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ ඇතුළත් කිරීමත්, හිස් ඉඩම්, අනේවාසික දේපළ සහ ධීවර වරායන් ආශ්‍රිතව ඇති භාවිතා නොවන / අත් හැර දැමූ හෝ හිමිකරුවකු නොමැති බෝට්ටු යනාදිය තුළ ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා නීතිමය ප්‍රතිපාදන සම්පාදනය කිරීමත් සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ ලේකම්, මහා මාර්ග අමාත්‍යාංශ ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්, ධීවර අමාත්‍යාංශ ලේකම් හා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් ගෙන් සමන්විත කමිටුවකට බලය පැවරේ.

2.11. ඩෙංගු රෝග වසංගත තත්ත්වයක අවදානම පිළිබඳව ජාතික, පළාත් හෝ දිස්ත්‍රික් සෞඛ්‍ය අංශ විසින් දන්වා සිටින අවස්ථාවන්හිදී, අදාළ පාර්ශවයන්ගේ ක්‍රියාකාරී සහයෝගය සෞඛ්‍ය අංශ වෙත ලබා දීම ප්‍රමුඛ කර්තව්‍යයක් ලෙස සැලකිය යුතුය. තවද, අවස්ථානුකූලව ඩෙංගු මර්දන හා පාලන කටයුතු සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම ආයතන ප්‍රධානීන් විසින් නොපමාව සිදු කළ යුතුවේ.

ඩෙංගු මර්දනය සහ පාලනයේදී ඉහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා පමණක් සීමා නොවී ඩෙංගු රෝගය වසංගත තත්ත්වයෙන් පැතිරයාම වැළැක්වීමට ගත හැකි සියලු ක්‍රියාමාර්ග සඳහා ප්‍රමුඛත්වය දී කටයුතු කළයුතු අතර, ඉහත උපදෙස් ඔබ යටතේ පවතින සියලු ආයතන වෙත නොපමාව දැනුම් දීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. ඩෙංගු මර්දනය සඳහා ඔබ සහ ඔබගේ කාර්ය මණ්ඩලය දක්වන සක්‍රීය දායකත්වය බෙහෙවින් අගය කරමි.

පී. බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්

පිටපත්:
1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
3. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
4. අධ්‍යක්ෂ, ජාතික ඩෙංගු මර්දන ඒකකය